
පළවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ, අප්‍රේල් 2012



තෝමස් එස්. මොන්සන්
සභාපතිවරයා විසිනි

# "උන්වහන්සේ නැගිටුණුසේක"

## අනාගතවක්තෘවරයෙකුගේ සාක්ෂිය

"ක්‍රිස්තියානි ලෝකයේ කාහල නාදය නම්," නාසරියේ යේසුස්වහන්සේ මරණයෙන් නැවත නැගිටීම යයි තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා ප්‍රකාශකර ඇත. "නැවත නැගිටීමේ යථාර්ථය මගින් සියල්ලන්ටම ලබාදෙන සමාදානය කිසි නුවණකින් දැනගත නොහැකිය" (බලන්න පිලිප්පි 4:7).[1]

පහත සඳහන් උපුටාගැනීම් තුලින්, මොන්සන් සභාපතිවරයා ගැලවුම්කරුවාණන්ගේ නැවත නැගිටීම ගැන සිය සාක්ෂිය බෙදාගෙන, ඒ ගැන ඔහුගේ කෘතඥතාවයද පළකරමින්, පුත්‍රයාණන් මරණය ජයගත් නිසා, පොළොවට පැමිණෙන පියාණන්ගේ සියලුම දරුවන් නැවතත් ජීවත්වන බවද ප්‍රකාශකරයි.

### මැරෙන සුළු ජීවිතයට එහා ජීවිතය

"ගෙත්සමනි උයනේදී ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් කළ දෙයෙහි සම්පූර්ණ වැදගත්කම අප කිසිවෙකුට තේරුම්ගැනීමට නොහැකි බව මම විශ්වාස කරමි, නමුත් අප වෙනුවෙන් කළ උන්වහන්සේගේ වන්දිගෙවීමේ පරිත්‍යාගය ගැන මගේ ජීවිතයේ හැම දිනකම මම කෘතඥවෙමි.

"අන්තිම මොහොතේදී, ආපසු යාමට උන්වහන්සේට හැකියාව තිබින. නමුත් උන්වහන්සේ එසේ කලේ නැතිසේක. සියලුම දේවල් ගලවාගැනීම සඳහා උන්වහන්සේ සියලුම දේවල පහළටම ගියසේක. එසේ කිරීම තුලින්, උන්වහන්සේ අපට මෙම මැරෙන සුළු පැවැත්මෙන් එහා පවතින ජීවනය ලබාදුන්සේක. ආදම්ගේ වැටීමෙන් උන්වහන්සේ අපව මුදවාගත්සේක.

"මගේ ආත්මයේ පත්ලෙන්ම, මම උන්වහන්සේට කෘතඥවෙමි. ජීවත්වන අන්දම උන්වහන්සේ අපට ඉගැන්වූසේක. මැරෙන අන්දම උන්වහන්සේ අපට ඉගැන්වූසේක. අපගේ ගැලවීම උන්වහන්සේ සුරක්ෂිත කළසේක."[2]

### මරණයේ අන්ධකාරය පහකිරීම

"දැඩි වේදනා සහ රෝගාබාධ වැනි, යම් අවස්ථාවලදී, මරණය කරුණාවේ දේවදූතයෙක් ලෙස පැමිණෙයි. නමුත් බොහෝ විට අප ඒ ගැන සිතන්නේ, මනුෂ්‍යයාගේ සතුටේ සතුරෙක් ලෙසය.

"මරණයේ අන්ධකාරය එළිදරව් කල සත්‍යයේ ආලෝකය මගින් සදහටම පහකළ හැකිය. 'නැවත- නැගිටීමද ජීවනයද මමය.' යයි ආචාරීන්වහන්සේ කීසේක. 'මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත්වන්නේය: ජීවත්ව සිටින කවුරු නුමුත් මා කෙරෙහි මා කෙරෙහි අදහන්නේද, ඔහු කිසි කලකත් නොනසින්නේය.'

"මෙම යලි තහවුරුකිරීම — ඔව්, ශද්ධවූ ස්ථිරකිරීම පවා — මෙම සොහොනෙන් එහා ජීවනය ගැලවුම්කරුවාණන් විසින් ලබාදීමට පොරොන්දුවූ සමාදානය සිය ගෝලයන්ට මෙසේ තහවුරු කලසේක: 'නුඹලා වෙත සමාදානය තබා යමි, මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැලඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙල්ලා'"[3]

### උන්වහන්සේ මෙහි නැත

"අපගේ ගැලවුම්කරුවාණන් නැවතත් ජීවත්වූසේක. මනුෂ්‍ය ඉතිහාසයේ වඩාත් මහිමාන්විත, සහනදායි සහ යළි තහවුරුකරන සියලුම සිදුවීම් සිදුවී ඇත — එය මරණය ජයගැනීමයි. ගෙත්සමනියේ සහ කල්වාරියේ වේදනාව සහ මහත් දුක් පීඩා පිසදා දමා ඇත. මනුෂ්‍ය වර්ගයාගේ ගැලවීම ආරක්ෂිතවී ඇත. ආදම්ගේ වැටීමෙන් මුදවාගෙන ඇත.

"එම පාස්කු උදෑසන හිස්වූ සොහොන යෝබ්ගේ ප්‍රශ්නයට පිළිතුරයි. 'මනුෂ්‍යයෙක් මැරුණාම ඔහු නැවත ජීවත්වන්නේද?' මගේ හඬ අසන සියලු දෙනාටම මම මෙසේ ප්‍රකාශ කරමි. මනුෂ්‍යයෙක් මැරුණාම, ඔහු නැවත ජීවත්වන්නේය, අපි එය දනිමු, මන්ද, අපට එළිදරව්කළ සත්‍යයේ ආලෝකය ඇත. …

"මගේ ආදරණීය සොයුරු සොයුරියනි, අපගේ දැඩි ශෝකාත්මක පැයේදී, එම පළවෙනි පාස්කු උදෑසන දේවදූතයාගේ වචනවලින්, එම ගැඹුරු සමාදානය ලබාගැනීමට අපට පුළුවන: 'උන්වහන්සේ මෙහි නැත, උන්වහන්සේ නැගිටුණුසේක'"[4]

### සියල්ලෝම නැවත ජීවත්නෝය

"අපි සිනාසෙන්නෙමු, අපි හඬන්නෙමු, අපි සෙල්ලම් කරන්නෙමු, අපි ප්‍රේම කරන්නෙමු, අපි ජීවත්වන්නෙමු, තවද ඉන්පසුව අපි මියයන්නෙමු. …

"තවද මරණය අප පොරොත්තුවන්නේ, එක් මිනිසෙක් සහ උන්වහන්සේගේ දූතමෙහෙය වෙනුවෙනි, එනම් නාසරියේ යේසුස්වහන්සේය. …

"මගේ මුළු හදවතින් සහ මගේ මුළු ආත්මයෙන්ම, මගේ සාක්ෂියේ හඬ ඔසවමින්, විශේෂ සාක්ෂියක් ලෙස, මම ප්‍රකාශකරමි, දෙවියන්වහන්සේ ජීවත්වනසේක, යේසුස්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන්ය, පියාණන්ගේ මාංශවත්වූ ඒකජාතක පුත්‍රයාණන්ය. උන්වහන්සේ අපගේ මිදුම්කරුවාණන්ය; උන්වහන්සේ පියාණන් හා අපගේ මැදහත්කරුවාණන්ය, අපගේ පාපවලට වන්දිගෙවීම සඳහා කුරුසිය මත මියගියේ උන්වහන්සේය. නැවත නැගිටීමේ පළමු ඵලය බවට පත්වූයේ උන්වහන්සේය. උන්වහන්සේ මියගිය නිසා, සියල්ලෝම ජීවත්වන්නෝය."[5]

### එක් පුද්ගලික සාක්ෂියක්

"මගේ පුද්ගලික සාක්ෂිය වන්නේ, මරණය ජයගෙන ඇති බවයි, සොහොනේ ජයග්‍රහනය දිනාගෙන ඇත. උන්වහන්සේ විසින් පූජනීය කර, ඉටුකරන ලද, එම වචන සියල්ලන්ටම නිසි ලෙස අවබෝධ වේවා. ඒවා සිහිතබාගන්න, ඒවා රැකගන්න, ඒවාට ගරුකරන්න. උන්වහන්සේ නැගිටුණුසේක."[6]

සටහන්

1. "He Is Risen," *Liahona,* අප්‍රේ. 2003, 7.
2. "At Parting," *Liahona,* මැයි 2011, 114.
3. "Now Is the Time," *Liahona,* ජන. 2002, 68; තවද බලන්න යොහාන් (11:25–26; 14:27.
4. "He Is Risen," *Liahona,* මැයි 2010, 89, 90; තවද බලන්න යොබ් 14:14; මතෙව් 28:6.
5. "I Know That My Redeemer Lives!" *Liahona,* මැයි 2007, 24, 25.
6. *Liahona,* අප්‍රේ. 2003, 7.

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

මොන්සන් සභාපතිවරයාගේ පණිවුඩයේ උපුටාගැනීම් බෙදාගැනීමෙන් පසුව, පාස්කුවේ සැබෑ අරුත ගැන උන්වහන්සේ දරන සාක්ෂිය සටහන්කර ගන්න. පහත සඳහන් ප්‍රශ්න පවුල් සාමාජිකයන්ගෙන් ඇසීමට ඔබට පුළුවන: "ජීවමාන අනාගතවක්තෘවරයෙක් වර්තමානයේ මෙම සත්‍යයන් ගැන සාක්ෂි දැරීම ගැන ඔබට අදහස්වන්නේ කුමක්ද? ඒවා ඔබගේ ජීවිතය තුල ඔබ අදාළකරගන්නේ කෙසේද?" ඔබගේ සාක්ෂිය එකතුකිරීම ගැන සළකා බලන්න.

## තරුණ අය

## මම නැවතත් උන්වහන්සේ දකිමි

**මෝගන් වෙබෙක් විසිනි**

පියා අප හැම කෙනෙක්ම විශේෂ කුඩා ළමයෙක් බවට පත් කළේය. ඔහු අපට ප්‍රේමකළ නිසා ලෙහෙසියෙන්ම අපට කමාවදෙයි. අප හැම කෙනෙක්ම සතුටින් තැබීමට ඔහු වගබලාගත් අතර, අප හොඳ ළමයින් වීම ඔහු අපගෙන් අපේක්ෂා කළේය. මම ඔහුට බොහෝ ප්‍රේම කළෙමි.

මා හයවෙනි ශ්‍රේණියේ සිටියදී, මගේ පියා රිය අනතුරකින් මියගියේය. මගේ පවුලේ අයගේ සහ මාගේද බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩවිය. අපගේ පවුලේ විශාල හිඩසක් ඇතිවිය. මා නැඹුරුවූයේ පියා වෙතටය, මට ප්‍රශ්නයක් ඇතිවූවිට මා ගියේත් ඔහු වෙතටය. උපකාර සෙවීම වෙනුවට, උදහසට සහ වේදනාවට මම ඉඩ දුනිමි. මා අවසානයේ තීරණය කලේ එය දෙවියන්වහන්සේගේ වරදක් බවය. මගේ ශුද්ධ ලියවිලි කියවීම සහ යාච්ඤාකිරීම මම නවතා දැමූමේ. මා සභාවට ගියේ මගේ මවට අවශ්‍යවූ නිසාය. මගේ ස්වර්ගික පියාණන්ගෙන් දුරස්ව සිටීමට මම උත්සාහ කළෙමි.

ඉන්පසුව මා පළමු වතාවට තරුණ කාන්තා කඳවුරකට ගියෙමි. අළුත් මිතුරියන් හමුවීම මම ප්‍රිය කළෙමි, නමුත් තවමත් මගේ ශුද්ධ ලියවිලි කියවීම කලේ නැත. පසුගිය රාත්‍රියේ, අපි සාක්ෂි රැස්වීමක් පැවැත්වූවෙමු. බොහෝ කාලයක් තිස්සේ යමක් නැතිවී ඇති බව මට හැඟිනි: එනම් ආත්මයාණන්වහන්සේය. නැගිට සිටිමින් තම සාක්ෂිය දැරූ ගැහැණු ළමයින්ට මම ප්‍රශංසා කරමි. නමුත් මා හිඳගෙන සිටියේ මට සාක්ෂියක් නැති බව මට සිතුන නිසාය. හදිසියේම නැගිට සිටීමට හැඟීමක් මට ඇතිවිය. කුමක් කියන්නේදැයි සිතමින්,

මම මුඛය විවර කළෙමි. තරුණ කාන්තා කඳවුර ගැන මගේ සතුට මම ප්‍රකාශ කළෙමි. ඉන්පසුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මා වනුවෙන් මියගිය බවත්, ස්වර්ගික පියාණන්වහන්සේ මට ප්‍රේමකළ බව සහ සභාව සත්‍ය බව මට ඉබේම කියවින.

විශිෂ්ට සමාදානයක් මා තුල පිරී පැවතින. මෙම අත්දැකීමට ස්තුති පූර්වකව, ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම සහ නැවත නැගිටීම නිසා නැවත වරක් මට මගේ පියා දකින්ට ලැබෙන බව මා දන්නා බව මට කිව හැකිය.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි, ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රිසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *First Presidency Message, April 2012* පරිවර්තනයයි. Sinhala. 10364 408

# ප්‍රේමකරන්න, ආරක්ෂා කරන්න සහ ශක්තිමත්කරන්න

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, අදාල පරිදි, ඔබ බැහැදකින සොහොයුරියන් හා එය බෙදාගන්න. ඔබගේ සොහොයුරියන් ශක්තිමත්කිරීමට සහ සහන සමිතිය ඔබගේම ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට උපකාරවත්වන ප්‍රශ්න අසන්න.*

**ඇදහිල්ල, පවුල, සහනය**

ගැලවුම්කරුවාණන් මෙන්, බැහැදකින ගුරුවරුද එකිනෙකාට සේවය සලසති (බලන්න 3 නෙපී 11:15). අපගේ සොහොයුරියන් මෙලෙස කියන විට, බැහැදකින ගුරුවරියන් ලෙස අප සාර්ථකව සේවයකරන බව අපි දනිමු: (1) මට ආත්මිකව වර්ධනයවීමට මගේ බැහැදකින ගුරුවරිය මට උපකාරකරයි; (2) මගේ බැහැදකින ගුරුවරිය මා ගැන සහ මගේ පවුල ගැන දැඩි සැලකිල්ලක් දක්වන බව මම දනිමි; සහ (3) මට ප්‍රශ්න තිබේ නම්, මා ඉල්ලීමක් කරන තුරු නොසිට, මගේ බැහැදකින ගුරුවරිය ක්‍රියාත්මකවන බව මම දනිමි.[1]

බැහැදකින ගුරුවරියන් ලෙස අප සොහොයුරියකට ප්‍රේමය සහ සැලකිල්ල දක්වා ඇය ශක්තිමත් කරන්නේ කෙසේද? පහත සඳහන්වන්නේ *Daughters in My Kingdom: The History and Work of Relief Society* යන අත්පොතේ 7 වෙනි පරිච්ඡේදයේ සඳහන් යෝජනා නමයකි

- දිනපතාම ඇය සහ ඇගේ පවුල වෙනුවෙන් යාච්ඤාකරන්න.
- ඇය සහ ඇගේ පවුල ගැන දැනගැනීමට ආනුභාවය සොයන්න
- ක්‍රමානුකූලව ඇය බැහැදැක ඇය සුවෙන් සිටීදැයි දැනගෙන ඇයට සහනය සහ ශක්තිය ලබාදෙන්න.
- බැහැදැකීම තුලින්, දුරකථන ඇමතුම්, ලිපි, ඊ-මේල්, කෙටි පණිවුඩ, සහ සරල කාරුණික ක්‍රියා තුලින් නිතරම සම්බන්ධතා ඇතිකරගන්න.
- සභා රැස්වීම්වලදී ඇයට සුභපතන්න.
- ඇයගේ හදිසි තත්වයකදී, රෝගීවූ විටදී, හෝ වෙනත් හදිසි අවස්ථාවකදී ඇයට උපකාර කරන්න.
- ශුද්ධ ලියවිලිවලින් සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ වලින් ඇයට සුභාරංචිය උගන්වන්න.
- යහපත් ආදර්ශයක් තැබීම මගින් ඇය ප්‍රබෝධකරන්න.
- ඔවුන්ගේ සේවය ගැන සහ සොහොයුරියගේ ආත්මික සහ ලෞකික සුභසාධනය ගැන සහන සමිතියේ නායිකාවට වාර්තාකරන්න.

### *අපගේ ඉතිහාසයෙන්*

"ජෝසෆ් ස්මිත් ඉගැන්වූ ලෙස, ලෝකය මුළුල්ලේම සිටින පසු-දවස්වල ශුද්ධවන්ත කාන්තාවන්ට ප්‍රේමකිරීමට, පෝෂණයකිරීමට, සහ සේවයකිරීමටද — 'දෙවියන්වහන්සේ විසින් [අපගේ] පපුව තුලට දැමූ අයට කාරුණිකවී' ක්‍රියාකිරීමේ මෙවලමක් බවට බැහැදැක ඉගැන්වීම පත්ව ඇත."[2]

මෑතකදී වැන්දඹුවක් බවට පත්වූ සොහොයුරියක් ඇයගේ බැහැදකින ගුරුවරිය ගැන මෙසේ කීවාය: "ඔවුහු ඇහුම්කන් දුන්හ. ඔවුහු මා සැනසූහ. ඔවුහු මා සමග හැඬූහ. තවද ඔවුහු මා ප්‍රේමයෙන් වැළඳගත්හ. … මා හුදකලාවූ පළමු මාස කිහිපයෙහිදී දැඩිව බලාපොරොත්තු කඩවී, දොම්නස්ව සිටියදී [ඔවුහු] මට උපකාර කළහ."[3]

ලෞකික වැඩවලට උදව්වීමද, සේවයකිරීමේ ක්‍රමයකි. 1856 ඔක්තෝබර් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, බ්‍රිගම් යං සභාපතිවරයා මෙසේ නිවේදනය කළේය. අත් කරත්ත පුරෝගාමීන් සැතපුම් 270–370 (කි.මී 435-595) අතර දුරකින් හිම පතනයකට හසුවී අතරමංවී සිටින බව කීවේය. ඔවුන්ව ගලවාගැනීමට පසු-දවස්වල ශුද්ධවන්තයන් කැඳවූ ඔහු, "අප ලෞකික යනුවෙන් හඳුන්වන දේවල් ගැන ඔවුන් වෙනුවෙන් තදින්ම සොයාබැලීමටද කීවේය."[4]

ලූසී මෙසර්ව් ස්මිත් මෙසේ සටහන් කළාය. කාන්තාවන් ඔවුන්ගේ උණුසුම් යට සායවල් සහ දිග මේස් දේවස්ථානය තුලදී ගලවා, තද ශීතලෙන් සිටින පුරෝගාමීන්ට යැවීම සඳහා ඒවා කරත්තවල ඇසුරූහ. ඉන්පසුව ඔවුහු ඇඳුම් පැළඳුම් ස්වල්පයක් ඇතිව අවසානයට පැමිණෙන අය සඳහා ඇඳ රෙදි සහ ඇඳුම් එකතු කළහ. අත් කරත්ත කණ්ඩායම පැමිණිවිට, නගරයේ ගොඩනැගිල්ලක "ඔවුන් සඳහා කළමනා ගොඩගසා තිබින."[5]

**සටහන්**

1. බලන්න ජූලී. බී. බෙක් "What I Hope My Granddaughters (and Grandsons) Will Understand about Relief Society," *Liahona,* නොවැ. 2011, 113.
2. *Daughters in My Kingdom: The History and Work of Relief Society* (2011), 112.
3. *Daughters in My Kingdom,* 119–20.
4. බ්‍රිගම් යං, "Remarks," *Deseret News,* ඔක්තෝ. 15, 1856, 252.
5. බලන්න *Daughters in My Kingdom,* 36–37.

### *ශුද්ධ ලියවිලි වලින්*

ලූක් 10:38–39; 3 නෙපී 11:23–26; 27:21

### *මට කුමක් කළ හැකිද?*

**1.** මගේ සොහොයුරියන්ගේ අවශ්‍යතාවයන් මා දැනගන්නේ කෙසේද?

**2.** මා සොහොයුරියන් ගැන ඉතා සැලකිල්ලෙන් සිටින බව ඔවුන් දැනගන්නේ කෙසේද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *Visiting Teaching Message, April 2012* පරිවර්තනයයි. Sinhala. 10364 408